**ශීර්ෂ 314 දකුණු පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

**1. දැක්ම , මෙහෙවර හා කාර්යභාරයන්**

**1.1 දැක්ම**

මානව හිතවාදී පාලන රටාවක් තුළින් සෞභාග්‍යමත් දකුණු පළාතක්.

**1.2 මෙහෙවර**

මානව, මූල්‍ය හා භෞතික සම්පත් සැලසුම් සහගත ලෙස උපයෝජනය කිරීමෙන් සහ කළමනාකරණය තුළින් ආර්ථික හා සමාජයීය වශයෙන් දකුණු පළාතේ මහජනතාවගේ ජන ජීවිතය නංවාලීම සහ ජාතික සංවර්ධනයට දායකත්වය ලබාදීම.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දකුණු පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.22,876,604,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.17,331,542,965 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.5,545,061,035 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ක් ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට<br>ශුද්ධ ප්‍රතිපාදනය | <br>වියදම | <br>ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 20,781,604,000 | 15,785,604,000 | 4,996,000,000 | 24 |
| මූලධන | 2,095,000,000 | 1,545,938,965 | 549,061,035 | 26 |
| **එකතුව** | 22,876,604,000 | 17,331,542,965 | 5,545,061,035 | 24 |

මධ්‍යම රජය විසින් ලබාදී තිබුණු ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ උපයෝජනය කර තිබුණු අතර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.